ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

R.R

(26)

චක්‍රලේඛ අංක. 91/04

මගේ අංකය: 5/1/දිවක
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
321, ගාලු පාර, කොළඹ 03.
1991.05.08.

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත,

**නීත්‍යානුකූල පැවරීමේ ලේඛණවල වැරදි නිවැරදි කිරීම**

මගේ සමාංක හා 1991.04.19. වන දින දරන චක්‍රලේඛය අනුව දීමනා පත්‍රවල සංශෝධනයන් කිරීම සියළුම පළාත් සහකාර ඉඩම් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරා ඇතත්, ක්‍රියාත්මක කිරීමේදී යම් යම් අපහසුතා පැන නැගී ඇති හෙයින් මින් ඉදිරියට එවැනි දීමනා පත්‍ර සංශෝධනය කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් හා සහකාර ඉඩම් කොමසාරිස්වරුන්ට පමණක් බලය පවරමි.

02. පැවරීම් ලේඛණයක හෝ, ලිපිගොනුවේ හෝ එම ලේඛණයේ ලිපි දෝෂයක් හෝ වෙනත් සංශෝධනයක් කිරීමට අවශ්‍ය වූ විටෙක 454 වන අධිකාරිය වූ රජයේ ඉඩම් ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ එවැනි සංශෝධනය කළ හැකි වේ. මේ පිළිබඳව ඉඩම් කාර්ය සංග්‍රහයේ රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග අංක.210 ද (215 පිටුව) කරුණාකර බලන්න.

03. උදාහරණයක් වශයෙන් යම් දීමනා පත්‍රයක, යම් වැරදි අංකයකින් සඳහන් වී තිබුනහොත් රජයේ ඉඩම් කාර්ය සංග්‍රහයේ 253 පිටුවේ සඳහන් ඉඩම් නියෝග 210:2 යටතේ දැක්වෙන වැරදි නිවැරදි කිරීමේ ආකෘතිය පරිදි කටයුතු කළ හැකි වේ.

04. එම සටහන වෙනම කඩදාසියක නොයොදා අදාළ දීමනා පත්‍රයේ අවසාන පිටුවේ ඇතුළත් කරන ලෙසත්, සංශෝධනය කළ යුතු වචන රතු ඉරකින් කපා හැර සංශෝධනය රතු තින්තෙන් ඇතුළත් කරන ලෙසත් දන්වමි. එම වරද නිවැරදි කර දීමනා පත්‍ර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයට යවා ලියා පදිංචි කළ යුතුවේ.

05. මෙම වරද නිවැරදි කිරීම, 454 වැනි අධිකාරියේ රජයේ ඉඩම් ආඥා පනතේ 189 වන නියෝගය අනුව, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන අනිකුත් සියළුම පැවරීමේ නීත්‍යානුකූල ලේඛන සඳහා ද අදාළ වේ.

සඳසිරි විතාරච්චි.
ඉඩම් කොමසාරිස්.

පිටපත්:-

1. රෙජිස්ට්‍රාර් ජනරාල් - සියළුම අ.දි.රෙ.වරුනට දැන්වීම සඳහා